




## ශාරුක් ගේ දියණියත් රඟපාන්නේ නැහැ



හින්දි සිනමාවේ සුපිරි නළු ශාරුක් ඛානගේ දියණිය සුහානා පසුගිය දා පළමුවරට චිත්‍රපටයක රඟපෑමට එක්වෙන බවට ඇති ප්‍රචාරය බොරුවක් බයි කැයැ-වෙන්න. ඇය 'Kabhi Alvida Naa Kehna' චිත්‍රපටයේ පිරිමි දරුවෙකු ලෙස රඟපාන්නට යන බවකුයි මුලින් කියැවුණේ. ශාරුක් ගේ පුතා ආර්යන් 'Kabhi Kushi Kabhie Gham' චිත්‍රපටයේ රඟ පෑ බව ඔබට මතක ඇති.

ඉන්දියාවේ දී King Khan ලෙස ආදරයෙන් හැඳින්වෙන ශාරුක් සිය 40 වන උපන්දිනය සැමරුවා. ඉතා තදින් දුම් පානයට ඇබ්බැහි වී සිටින ශාරුක් ඒ පුරුද්දට ආයුබෝවන් කියන්නට සැරසෙන බවකුත් වාර්තා වෙනවා.

## 'Garam Masala'
## ඇමරිකාවේ ආදායම් වාර්තා තබයි

'Garam Masala' සිනමා පටය ඇමරිකාවේ අතිශය සාර්ථක අන්දමින් ප්‍රදර්ශණය වන බව වාර්තා වෙයි. මේ වන විට එය ඩොලර් ලක්ෂ අටකට වඩා වැඩි ආදායමක් උපයා ඇති බවයි කියැවෙන්නෙ. 'ආක්ෂේ කුමාර් Garam Masala' හි ප්‍රධාන චරිතය නිරූපනය කරයි.

මේ නමින් ම යුතු හින්දි චිත්‍රපටයක් 1972 දී නිපදවනු ලැබූ බව සමහර විට ඔබ නොදන්නවා ඇතී මෙහ්මූඩ් බින්දු අරුණා ඉරානි වැනි නළු නිළියන් රඟපෑ එම චිත්‍රපටයේ සුපිරි නළු අමිතාබ් හච්චන් ගරු රඟපෑමක යෙදුනා.

### මං මේවා ඉගෙන ගත්තේ අමිතාබ් ගෙන් - ආක්ෂේ කියයි

නොවැම්බර් 23 වන දා ගුවන්විදුලි සේවයක සම්මුඛ සාකච්ඡාවකට සහභාගි වෙමින් ජනප්‍රිය බොලිවුඩ් තරුව ආක්ස් කියා සිටියේ දර්ශණ රූ ගත කිරීම් අතර තුරදී සහෝදර නළු නිලියන්ගේ ඇස් රතු වන විහිලු වැඩ කිරීම තමා ඉගෙන ගත්තේ මහා නළු අමිතාබ් හච්චන් ගෙන් බවයි.

අමිතාබ් හච්චන් පී මගේ ගුරුවරයායි ආත්ෂේ කියන්නෙ හිනාවෙමින් .Hera Pheri' සිනමා-පටයේ එක් දර්ශණයක් මම පරේෂ් ට ළුණු ගෙඩි වලින් ගහන දර්ශණයක් තියෙනවා. දර්ශණය රූ ගත කිරීමෙදි මම ළූණු ගෙඩි දක තුනකට පස්සෙ බිත්තරයක් යැව්වා. පරේෂ් ඒක අල්ලලා ඇඟ පුරාම බිත්තර සාරු නා ගත්තා.

හැබැයි ඉතින් මොන විහිළුව කළත් ඒවා බොහොම පරිස්සමින් කරන්න

### ඇයිෂ්වර්යා

ඇමරිකාව් ටයිම් සහ චීනයේ බීජිං රිව්ව් සඟරා වල පිට කවර සැරසූ හින්දි සිනමාවේ සුරූපිය අයිෂ්වර්යා රායි ප්‍රථම වතාවට පසුගිය දා රුසියානු සඟරාවක පිට කවරය සැරසුවා. රුසියානු ටීවී පාක් සඟරාව කියන්නේ ඇය ලෝකයේ සුරූපීම නිළිය බවයි.



